# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
## CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My Ref. | CSS/7/1/3 | ඔබේ අංකය<br>உனது இல<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2019.07.24 |

**ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 04/2019**

දකුණු පළාතේ සියළුම,

ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් හා

ගණන් දීමේ නිලධාරීන් වෙත,

**<u>සති අන්ත හා රජයේ නිවාඩු දිනවල සේවය කිරීම වෙනුවෙන් දින වැටුප් ගෙවීම සඳහා අනුමත කිරීමේ බලය අමාත්‍යාංශ ලේකම්වරුන්ට පැවරීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් මාගේ අංක CSS/7/6/3/2/2013 ,CSS/7/1/4/1 -1 ,CSS/7/5/6/1 හා,CSS/7/1/4 දරණ 2013.11.25, 2014.02.12, 2014.07.09,2015.07.30,2017.03.01,2019.05.10 දිනැති උපදෙස් ලිපිවලට අමතර වශයෙනි.

**02.**ඉහත ලිපි මඟින් මාණ්ඩලික නිලධාරීන්ගේ සති අන්ත හා රජයේ නිවාඩු දිනයන්හි සේවයේ නිරත වීම සම්බන්ධයෙන් අනුමැතිය ලබා ගැනීම පිළිබඳව පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් දැනුවත් කර ඇත.

**03.** දකුණු පළාත් අමාත්‍යාංශ හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු ප්‍රධානීන් ඇතුළු මාණ්ඩලික නිලධාරීන්ගේ නිවාඩු දින වැටුප් දින 04ක් දක්වා අනුමත කිරීමේ බලය 2019.08.01 දින සිට පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන්ට පැවරීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය 2019.07.19 වන දින සිට ලබාදී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/SP/1/2/1/1/19 හා 2019.07.22 දිනැති ලිපියෙන් දන්වා එවා ඇත.(එම ලිපියේ පිටපතක් මේ සමඟ අමුණා ඇත)

**04.**මෙසේ සති අන්ත හා රජයේ නිවාඩු දිනවල නිවාඩු දින වැටුප් අනුමත කිරීමේදී තිබෙන මූල්‍ය ප්‍රතිපාදන හා රජයට වැය බරක් නොවන පරිදි විචක්ෂණශීලිව සලකා බලා අනුමත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස දකුණු පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන්ට කාරුණිකව දන්වනු ලබයි.

**05.**නිවාඩු දින වැටුප් දින **04**කට වඩා **ඉල්ලීම් කරන අවස්ථාවලදී පමණක්** අනුමැතිය සඳහා ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය.


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary: 091 2232343
කාර්යාලය / காரியாலயம் / Office: 091 2234052, 091 2226118
ෆැක්ස් / பெக்ஸ் / Fax: 091 2246299
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail: chiefse-1@sltnet.lk
වෙබ් අඩවිය / இ தளம் / Web site: www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.


"විශිෂ්ටත්වයෙන් ① ට එන යහපාලනයක්"

**06**.එසේ දින 04කට වඩා වැඩි නිවාඩු දින වැටුප් ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කළ යුත්තේ **ඉතාමත් හදිසි හා අත්‍යාවශ්‍ය රාජකාරි කටයුතු සඳහා** පමණක් විය යුතු අතර, ඒ සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය සහිතව ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ

**07**.සති අන්ත හා රජයේ නිවාඩු දිනවල දින වැටුප් ගෙවීමේදී 2013.10.09 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 21/2013 සහ ආයතන සංග්‍රහයේ VIII වැනි පරිච්ඡේදයේ 10 වගන්තියට අනුව දිනකට පැය 08කට නොඅඩු කාලයක් රාජකාරියේ යෙදිය යුතුය.

**08**.තව දුරටත්,පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ නිවාඩු දින වැටුප් අනුමත කිරීම සඳහා ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු බවද සඳහන් කරමි.

**09**.එසේම ඉහත උපදෙස් පිළිබඳව ඔබ ආයතනයේ හා යටත් ආයතනවල නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසද කාරුණිකව දන්වමි.

**ආර්.සී.ද සොයිසා,**

ප්‍රධාන ලේකම්,

දකුණු පළාත.

පිටපත්-

01. සහකාර විගණකාධිපති, දකුණු පළාත : දැ.ගැ.ස
02. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, දකුණු පළාත : දැ.ගැ.ස

" විශිෂ්ටතම රාජ්‍ය සේවයක් උදෙසා"

# ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
# ஆளுநர் செயலகம்
# GOVERNOR'S SECRETARIAT

**දකුණු පළාත, පහළ ඩික්සන් පාර, ගාල්ල**
தென் மாகாணம், கீழ் டிக்சன் வீதி, காலி.
Southern Province, Lower Dickson Road, Galle.

මගේ අංකය / எனது இல / My No. G/SP/1/2/1/1/19
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date 2019.07. 22

ලේඛනා
24 JUL 2019
ප්‍රධාන ලේකම්
දකුණු පළාත.
D/F

ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

**නිවාඩු දින වැටුප් අනුමත කිරීමේ බලය අමාත්‍යාංශ ලේකම්වරුන්ට පැවරීම සම්බන්ධයෙනි.**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ අංක CSS/7/9/4/1 හා 2019.06.25 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව අමාත්‍යාංශ හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ නිවාඩු දින වැටුප් අනුමත කිරීම දින 04 ක් දක්වා ඒ ඒ අමාත්‍යාංශ ලේකම්වරු වෙත පැවරීමටත්, නිවාඩු දින වැටුප් දින 04 කට වඩා වැඩි අවස්ථා වලදී පමණක් අනුමැතිය සඳහා ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කිරීමටත්, සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ නිවාඩු දින වැටුප් ප්‍රධාන ලේකම් වෙත යොමුකර අනුමත කර ගැනීම සඳහාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය 2019.07.19 වන දින ලද බව කාරුණිකව දන්වා සිටිමි.

03. එසේම නිවාඩු දින වැටුප් අනුමත කිරීමේදී තිබෙන මූල්‍ය ප්‍රතිපාදන රජයට බරක් නොවන පරිදි කළමනාකරණය කර ගන්නා ලෙසද වැඩි දුරටත් දන්වා සිටිමි.

ඒ.යූ.වේලාරත්න
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත.

**ඒ.යූ.වේලාරත්න**
**ආණ්ඩුකාර ලේකම් - දකුණු පළාත**
**ආණ්ඩුකාර ලේකම් කාර්යාලය**
**පහළ ඩික්සන් පාර,ගාල්ල**